# ටීනා සහ පුංචි සිළුන



සෙනුලි සහනයා අමුණුපුර

# ටීනා සහ පුංචි සිඟිත

කතෘ

**සෙනුලි සහනායා අමුණුපුර**

චිත්‍ර සහ කෘතියේ අයිතිය - සෙනුලි සහනායා අමුණුපුර
**ISBN – 978-624-206-935-7**
දිනය - **15.11.2023**

## පිදුම

මෙම කෘතිය ලිවීමට මා හට සහයෝගය ලබා දුන්

මාගේ ආදරණීය අම්මාට, තාත්තාට සහ

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමග පෙන්වන

මාගේ ආදරණීය රේණුකා රාජපක්ෂ

ගුරුමැණියන්ට ඉතා ගෞරවයෙන් මේ කෘතිය

පුදමි.

*මෙම පොත සැදීමට මා හට උදව් උපකාර*

*කළ සියලු දෙනාටම*

*මාගේ ස්තූතිය පුද කරමි.*

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවත් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්ත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනා කරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

පුංචි ගෙදරක ටීනා කියලා පුංචි ගැහැණු ලමයෙක් ජීවත් වුණා. එයාගේ පවුලේ අය ටීනා ට හරිම කැමතියි. ඒ මොකද එයා හැමදාම හිනා වෙලා සිටිය නිසා එයාගේ මූණ සඳක් වගේ. දත් මුතු ඇට වගේ ලස්සනයි.





එයා උදෙන්ම නැගිටලා මල් පැල වලට සාත්තු කළා

ටීනාගේ ගෙදර පළා වර්ග ගොඩක් හදල තිබුණා.

ගොටුකොළ , නිවිති, සාරණ, මුකුණුවැන්න වගේම

මල් පැලත් ගොඩක් තිබුණා.

තවත් ගමක සිළුන කියලා පුංචි පිරිමි ළමයෙක් සිටියා.

සිළුන සහ ටීනා හොඳම යාළුවෝ හැමදාම හවසට

එයාලා දෙන්නා එකතුවෙලා සෙල්ලම්  කලා.



සිළුනගෙ නිවස පිටුපස ලොකු කැලැවක් තිබුණා දවසක් දා ටීනා කිව්වා " සිළුන අපි ඒ කැලැව බලන්න යමු" කියලා. ඉතින් දෙන්නම දවසක් කැලැව බලන්න ගියා. එ කැලයේ මොණරු, හාවෝ, ගොන්නු වගේම ලස්සන කුරුල්ලෝ ගොඩක් හිටියා. ලස්සන ලස්සන මල් වර්ගද ගොඩක් තිබුණා.



එයාලා දෙන්නා නටමින් ගොඩක් ප්‍රීති උනා. දන්නෙම නැතිව කළුවර වැටුණා. යාළුවෝ දෙන්නටම ගෙදර යන පාර අමතක උනා. කළුවර වැටුණු නිසා පාර පේන්නේ නැතුව ගියා.



එකපාරටම ටීනා කැලයේ තිබුණු ලොකු වළකට වැටුණා. සිළුන ටීනා ව බේරාගන්න උත්සාහ කරා.කළුවර නිසා ලණු පොටක් වත් හොයාගන්න බැරිවී ගියා. ටීනා හොඳටම ඇඬුවා. සිළුන ටත් හරිම දුකයි. සිළුන සහ ටීනා හයියෙන් අඬන්න ගත්තා.



මේ ඇඩිල්ල ඒ අසල හිටපු සුරංගනාවියකට ඇසුණා. සුරංගනාවියට හිතුනා මේ පුංචි යාළුවෝ දෙන්නට උදවු කරන්න ඕනේ කියලා සුරංගනාවිය  වෙස් වලාගෙන ටීනා වැටිලා හිටියා වල ළඟට ගියා. "ඇයි මේ දරුවෝ  අඩන්නේ" සුරංගනා විය ඇහුවා. "අනේ මාව බේරගන්න" කියලා ටීනා කිව්වා.



සුරංගනාවිය සිළුනගේත් උදවු ඇතුව  ලොකු ලණු පොටක් වලට දාලා ටීනා ව වළෙන් ගොඩට ගත්තා ටීනා සහ සිළුන සුරංගනාවියට ගොඩක් ස්තූතියි කලා. ඒත් යාළුවෝ දෙන්නා දන්නේ නෑ මේ සුරංගනාවියක් කියලා.



එතකොටම සුරංගනාවිය එයාගෙ සැබෑ ස්වරූපයට ආවා. සිළුනටයි ටීනාටයි හරිම පුදුමයි. ඊට පස්සේ ටීනා සේරම විස්තරය සුරංගනාවියට පැහැදිලි කරා.

සුරංගනාවිය පුංචි යාළුවෝ දෙදෙනාටම නිවසට යන පාර හොයාගන්න උදව් කරා. ටීනා සහ සිළුන සුරංගනාවියට ගොඩක් ස්තුති කලා. ගෙදර යන විට ගෙදර මව්පියන් ගොඩක් කලබල වෙලයි හිටියේ. ටීනා සහ සිළුන දැකලා ගෙදර අය ගොඩක් සතුටට පත් උනා.



මීට පස්සේ නම් ගෙදරට කියන් නැතුව කොහෙවත් යන්න එපා කියලා මව්පියන් අවවාද දුන්නා. දෙදෙනාම අවවාද සතුටින් පිළිගත්තා.



නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩීම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත් ත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිමාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01